අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක :- JSC/SEC COR : 06

සියලුම
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/ මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ / අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>කොවිඩ් - 19 වෛරසය පවතින කාලය තුල උපලේඛනගත රජයේ නිලධරයන් විසින් අභියාචනා ඉදිරිපත් කිරීම.</u>**

කොවිඩ් - 19 වෛරසය පවතින කාලය තුල උපලේඛනගත රජයේ නිලධරයන් විසින් ස්වකීය අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට පැමිණීම අවශ්‍ය නොවන අතර ඒ සම්බන්ධයෙන් නැවත දැනුම් දෙනතුරු පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බව මෙයින් දන්වමි.

i. අදාල නිලධාරියා/නිලධාරිනිය විසින් සිය අභියාචනය තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව පහත සඳහන් ෆැක්ස් අංකය මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත මුලින්ම යොමුකළ යුතුය.
ෆැක්ස් අංකය - 0112446111

ii. එලෙස ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් එකී නිලධාරියාට/නිලධාරිනියට තවදුරටත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්ට පුද්ගලිකවම කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් පමණක්, ඒ සඳහා පහත සඳහන් දුරකථන අංකයට ඇමතුමක් ලබා දී ලියාපදිංචි විය යුතුය.

iii. එසේ ලියාපදිංචි වීම සඳහා සතියේ සඳුදා හෝ අඟහරුවාදා දිනයන්හි අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් (I ශ්‍රේණිය) එල්.ඩී.ඒ.බී.යූ.ගුණවර්ධන මහතා වෙත දුරකථන ඇමතුමක් ලබා දී ඒ සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කරවා ගත යුතුය.

iv. ඒ අනුව අවශ්‍යතාවය සලකා බලා එක් නිලධාරියෙකුට/නිලධාරිනියකට සතියේ බදාදා දිනක විනාඩි 05 ක උපරිම කාලයක් දුරකථනයෙන් අදාල ගැටළුව සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු සමඟ සාකච්ඡා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීමට කටයුතු කරනු ඇත.

v. ලියාපදිංචිය සහ ගැටළුව සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා අංක 0112433119 දරණ දුරකථනය ඇමතිය යුතුවේ.

02. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉහත සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජය විසින් ඉදිරිපත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයේ සහ නිර්දේශයන් අනුව බව අවධාරණය කරන අතර ඒ පිළිබඳව ඔබගේ අධිකරණයේ සේවය කරනු ලබන සියලුම උපලේඛනගත රජයේ නිලධරයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමි.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2020 මැයි මස 13 වන දින.
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

**එච්. සංජීව සෝමරත්න**
**ලේකම්**
**අධිකරණ සේවා කොමිෂන් සභාව**
**කොළඹ 12**